ඔබේඅංකය
உமது இல

මගේඅංකය
எனது இல
My No.

දිනය
திகதி
Date 2023.01.12

දුරකථනඅංක
தொலைபேசி இல
Telephone Nos. +94812392305 +94812392306

ෆැක්ස්
தொலைநகல்
Fax +94812388102

විද්‍යුත් තැපැල
ஈமெயில்
E mail dvc@pdn.ac.lk

# පේරාදෙණියවිශ්වවිද්‍යාලය,ශ්‍රී ලංකාව
## பேராதனைப் பல்கலைக்கழகம், இலங்கை
## UNIVERSITY OF PERADENIYA, SRI LANKA

## *Vice-Chancellor's Office*

### සියලුම ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ දැන ගැනීම සඳහා

ප්‍රිය සිසු සිසුවියනි,

සැම විශ්වවිද්‍යාල ශිෂ්‍ය ශිෂ්‍යාවක්ම යහපත් විද්‍යාථර්යෙකු බවට පත්කිරීම සඳහා විශ්වවිද්‍යාලයේ සියළුම අධ්‍යයන, පරිපාලන හා අනධ්‍යයන කායර් මණ්ඩලය සිය වගකීම නිරන්තරයෙන් ඉටු කරමින් සිටින බව ඔබ දන්නා කරුණකි.ඒ අනුව අධ්‍යයන කටයුතු මැනවින් හදාරා ඉන් උපරිම ප්‍රයෝජන ලබාගෙන ඔබ සැම රටට දැයට යහපත් පුරවැසියකු බවට පත්වනු ඇතැයි අප රටේ අධ්‍යාපනය සඳහා මුදල් ගෙවන සැම පුරවැසියෙකුගේම පරම අභිලාශයයි.

එම නිසාඅප කළ යුත්තේ එක් දිනක්, එක් පැයක් හෝ එක් තත්පරයක් හෝ අනවශ්‍ය ලෙස අපතේ හැරීම නොව එම ජනතාවගේ සහ ඔබගේ බලාපොරොත්තු මල්ඵල ගන්වමින් ඔබ පැමිණි අධ්‍යාපන අරමුණ වෙත ළගා වීමය.

2022.12.10 වන දින විශ්වවිද්‍යාලය තුළදී හිටපු උපකුලපතිවරයෙකුට, ඔහුගේ නිවසට හා පවුලේ සාමාජිකයින්ට එල්ල කළ ප්‍රහාරය සදාචාර සම්පන්න කිසිවකුත් අනුමත නොකරන විනය විරෝධී ක්‍රියාවකි. එසේම අනවසරයෙන් එම නිවාස පරිශ්‍රයට ඇතුල් වූ සැම ශිෂ්‍යයෙකුම සිදු කර ඇත්තේ වැරදි ක්‍රියාවකි. මෙම විනය විරෝධී ක්‍රියාවට සම්බන්ධ සිසුන්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක කිරීමට විශ්වවිද්‍යාල පාලනාධිකාරිය මෙන්ම රටේ නීතිය ක්‍රියාත්මක කරන ආයතන බැඳී සිටී. අප ක්‍රියා කරනුයේ රටේ නීතිය සහ විශ්වවිද්‍යාලයේ උප නීති සංග්‍රහයන්ට අනුකූලව බව ප්‍රකාශ කිරීමට කැමැත්තෙමි. ඒ අනුව එම සිදුවීමට මූලික වූ සිසුන් පිරිසකගේ ශිෂ්‍යභාවය පරීක්ෂණයකට යටත්ව අත්හිටුවීමට විශ්වවිද්‍යාල පාලනාධිකාරීය කටයුතු කරන ලදී. එසේම එම සිදුවීම සම්බන්ධයෙන් පරීක්ෂා කොට වාර් තා කිරීම සඳහා පත් කළ විනය කමිටුවක් විසින් එම සිදුවීමට සම්බන්ධ තවත් සිසුන් හඳුනා ගනිමින් සිටී. මෙම කරුණ හේතුකොට ගෙන එය ශිෂ්‍ය මර්ධනය හෝ ශිෂ්‍ය ක්‍රියාකාරීන් මර්ධනය ලෙස හුවා දක්වමින් විශ්වවිද්‍යාල පරිපාලනයට හෝ රටේ නීතිය ක්‍රියාත්මක කරන ආයතනවලට එරෙහිව සිසුන් මෙහෙයවීමට උත්සාහයක් පවතී. එම උත්සාහය ඔබ කිසිසේත් අනුමත නොකරනු ඇතැයි මම විශ්වාස කරමි.

කිසියම් ශිෂ්‍යයෙකු නිරදෝෂී යැයි ප්‍රකාශ කරන්නේනම්, ඒ බව විනය පරීක්ෂණ කමිටුවට සහ රටේ නීතිය ක්‍රියාත්මක කරන ආයතන වලට, සාක්ෂි සහිතව ඉදිරිපත් කිරීමෙන් අවශ්‍ය සහනය ලබා ගැනීමට අවස්ථාව ඇත. එසේ අවකාශ තිබිය දී සිසුන් විසින් උද්ඝෝෂණ ව්‍යාපාර හෝ විරෝධතාවයන් දැක්වීම තුළින් ඉහත විනය විරෝධී සිදුවීම සාධාරණීකරණය කිරීමක් සිදුවන අතර එවැනි සිදුවීම් කිසිසේත් විශ්වවිද්‍යාලය වැනිඋගත් බුද්ධිමත් සමාජයක සාධාරණීකරණය කළ නොහැක.

මෙවැනි තත්වයන් මත විශ්වවිද්‍යාල කටයුතුවලට බාධා පැමිණවීම මගින් අධ්‍යයන කටයුතු බිඳ වැටී තවදුරටත් සිදුවන්නේ ඔබගේ වටිනා කාලය විනාශ වීම විය හැක. එබැවින් මෙවැනි ක්‍රියාවන්ට ඔබ සම්බන්ධ නොවනු ඇතැයි අප උදක්ම විශ්වවාස කරමු.

ඔබගේ අධ්‍යාපන කටයුතු සාථර්ක කර ගැනීමට මා සුභ ප්‍රථර්නා කරමි.



මහාචාර් ය ටෙරන්ස් මධුජිත්
වැඩ බලන උපකුලපති

පොදුදුරකථන/பொதுதொலைபேசி/General Telephone -+94812388301-05, +94812390000, +94812392000
Web: www.pdn.ac.lk